## පියමං ඔස්සේ

### නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය

සබරගමුව කියන්නෙ මානව වංශකතාවට අලුත් පිටුවක් එකතු කරපු පළාත.
එහි නියමුවා වෙන්නෙ බලංගොඩ මානවයා.

බලංගොඩ මානවයා අපට කියල දෙනව ගහකොළ, ඇළ දොළ සතා සිව්පාවා එක්ක, කෙටියෙන්ම කියනව නම් ස්වභාවධර්මයත් එක්ක ජීවත් වෙන්නෙ කොහොමද කියල.
ඒ ජීවිතයට මනා ශික්ෂණයක් තිබුණ. ඒ වගේම ඒ තුළ සංවාදයක් තිබුණා.

එහෙම ගත්තම, මානව වංශ කතාවෙ මහගෙදර "සබරගමුව" කියල කියන්න පුළුවන් !

සැලසුම්කරණය කියන්නෙත් එක්තරා විධිහක ශික්ෂණයක් කියල අපි හිතනව.

වෙන විධියකට කියනවනම් සැලසුම්කරණය බැඳිල තියෙනව අපේ ආකල්ප, දැනුම හා කුශලතා මත පදනම් වෙච්චි අපගේ හැසිරීම් එක්ක.

ඒ වගේමයි, සැලසුම්කරණය කියන්නෙ සංවාදයක්.

මොකද, තිබෙන තත්ත්වය නිවැරදිව තේරුම් අරගෙන එය ධනාත්මකව වෙනස් කරල අලුත් දිශාවකට යන්න නම් සංවාදයක් උවමනා කරනව.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය කියන්නෙ සබරගමුවෙ සැලසුම්කරණයේ මහගෙදර.
සබරගමුවෙ සැලසුම්කරණයේ මහගෙදර හැටියට අපේ කාර්යාලයට අපි 2019-2023 කාල පරිච්ඡේදය සඳහා, මාර්ග සිතියමක් හදල තියනව.
ඒකට කියනව "කාර්යසාධනාභිවර්ධන උපායමාර්ගික සැලැස්ම" කියල.
ඉන් ඉදිරි පස් වසරක් තුළ ආයතනය ගමන් කළ යුතු මාර්ගය අඳුනගෙනයි තියෙන්නෙ.

මේ උපායමාර්ගික සැලැස්මෙන් කියවෙන විධියට "පළාත් ක්‍රමසම්පාදනයේ විශිෂ්ඨතම නියමුවා"  වෙන්න නම්, අපෙන් ප්‍රජාවට ඉටු වියයුතු සේවය කාර්යක්ෂමව වගේම සඵලදායීව ලබාදෙන්න ඕනි. ඒකට සිදුකළ යුතු මෙහෙවර අප එළිදක්වා තියෙනවා.

ඒ මෙහෙවර නොපිරිහෙලා ඉටු කරන්න අරමුණු, පරමාර්ථ, උපායමාර්ග හා ක්‍රියාකාරකම් ඔස්සේ පෙළගැසුණු ඉලක්ක මේ සැලැස්ම තුළ තියනව.

ඒ ඉලක්ක යථාර්ථයක් කරගන්න අපිට පුළුවන් උනාද කියල අපි කාර්යසාධන දර්ශක භාවිතා කරල මැන බලනවා.
ඒ අපේ ඉදිරි ගමන තව තවත් සාර්ථක කරගන්න.

අපේ උපායමාර්ගික සැලැස්මෙන් හඳුනාගත් විධිහට අපේ මෙහෙවර සහතික කරන්න අපි 2019 වර්ෂයේදී ප්‍රතිපත්ති රාමුවක් එළිදක්වලා තියනව.
වෙනදාට "සබරගමුව පළාත් ප්‍රතිපත්ති ප්‍රකාශය" කියල සම්ප්‍රදායිකව ඉදිරිපත් කරන ප්‍රතිපත්ති රාමුව වෙනුවට නවමු ආකාරයකින් මේ ප්‍රතිපත්ති රාමුව සකස් වෙලා තියනව.
"සබරගමු ගං ගලා බසී " කියල නම යොදල තියෙන  එහි ඇතුළත් ප්‍රතිපත්ති 15ත් වෙනදාට වඩා නිර්මාණශීලී හා නැවුම්.
සැලසුම්කරණය තුලින් ඵලදායී සංවාදයක් සහ ශික්ෂණයන් ඇති කරමින් සබරගමුව නවමු

දිශාවකට ගෙනයන්නයි මේ ප්‍රතිපත්ති මගින් යෝජනා කරන්නෙ.

- "සබරගමු කතිකාවත" - සබරගමුව නිවැරදිව දකින්න
- "පුරවැසි පාසල" - සාක්ෂර බවින් පිරිපුන් සමාජයක් උදෙසා
- "ගුරුහරු" - මිනිසත්කමින් පිරුණු සබරගමුවක්
- "සභාසංසද" - ජනතාවට කන්දෙන ප්‍රාදේශීය ආණ්ඩුවක්
- "දිරියට දිරිය" - ව්‍යාවසායකත්ව සංවර්ධනයට නව මානයක්
- "සමගි" - එකමුතුකමින් ශක්තිමත් ආණ්ඩුකරණයක්
- "නවත" - නව්‍ය වූ කෘෂිකාර්මික ප්‍රවේශයකට
- "නිරෝගී" - ගතින් සිතින් සුවපත් වූ සමාජයක් උදෙසා
- "ගෙදර වත්ත" ස්වයංපෝෂිත කුටුම්භයක්
- "අපේ ගෙදර" - අපිටම අපේ කියල ගෙදරක්
- "අලුත් පාර" - ගම ලෝකයට යා කරන මාවතක්
- "කිතුල කිතුළ" - කිතුලින් කිතුළක් සොයන ජන ජීවිතවලට
- "පෙළඹුම" පිහිටක් අවැසිවූවන්ගේ ජීවන ගමනට අත්වැලක්
- "සිත් සවි" - සවිමත් සිතක්, සුරක්ෂිත සමාජයක්
- "සොඳුරු සිතක්" - ජීවිතය විඳින්න

මේ ප්‍රතිපත්ති රාමුව හුදෙක් සංකල්ප 15ක් විතරක් ම නොවෙයි.

මේ සියල්ල ඒකාබද්ධතාවය, ප්‍රජා සහභාගිත්වය, සීමිත සම්පත් කාර්යක්ෂමව උපයෝජනය වැනි සැලසුම්කරණයේ මූලිකාංග මත ගොඩනගපු වැඩසටහන්.

මේ ප්‍රතිපත්ති රාමුව තුළින් අපේ පළාතේ මෙතෙක් ක්‍රියාත්මක කරපු වැඩසටහන්වල අඩුපාඩු හඳුනාගෙන ඒවා පළාතේ ප්‍රජාවට ප්‍රතිඵලයක් ලැබෙන වැඩසටහන් බවට පත් කරන්න වටපිටාව හදල තියනව.

"අපේ ගෙදර" කියන්නෙ ඉන් එක ප්‍රතිපත්ති රාමුවක්. ඒක තුළ තිබෙන්නෙ නිවාස වැඩසටහනක්. මේ ප්‍රතිපත්ති රාමුව හඳුන්වල දෙන්න කලින් පළාත් නිවාස සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වුණේ ගතානුගතික විදියට.
ඒ ක්‍රමවේදයෙන් බලාපොරොත්තු වුණු ප්‍රතිඵල නොලැබුණු අවස්ථා ගැන අපි ඉගෙනගත්තු පාඩම් "අපේ ගෙදර" සංකල්පය ගොඩනංවන්න අපි භාවිතා කළා.
ඒකෙ ප්‍රතිඵලයක් හැටියට "අපේ ගෙදර" තුළින් ප්‍රතිලාභ හිමිවිය යුතු නිවැරදි කණ්ඩායම හඳුනාගන්නත් පළාත පුරා සමබරව ප්‍රතිලාභ බෙදාහරින්නත් දැන් පුළුවන්.
ඒ වගේම, අද වන විට "අපේ ගෙදර" වැඩසටහන කියන්නෙ හිසට වහළක් තැනීමට අමතරව තමන්ගේ උත්සාහයත් මුසු කරලා සුරක්ෂිත බවක් තම පවුලට සහතික කිරීමක් හැටියට ප්‍රතිලාභීන්ගේ හදවතේ පැලපදියම් වෙලා තියනව.

"අලුත් පාර" කියන්නෙ ඒ වගේ තවත් සංකල්පීය රාමුවක්.
අපේ පළාතේ විතරක් නෙවෙයි රටෙත් නගර, ගම් දනව් යාකරමින් එක එක ශ්‍රේණියේ මාර්ග එක එක ආයතන මැදිහත්වෙලා එක එක මට්ටම්වලින් හදනව.
සංවර්ධනයට යන්න නම් මේ පාරෙන් දිගටම ගියොත් අමාරු වෙන බව දැනගත් අපි "අලුත් පාර" ප්‍රතිපත්ති රාමුව සකස් කළා.
පැරණි ක්‍රමය නිසා සිදුවෙන ද්විත්වකරණය වළක්වගෙන සියලුම මාර්ග එක යාන්ත්‍රණයක් තුළ හොඳ ප්‍රමිතියකට හදන්නත් ඒවා විධිමත්ව නිතිගත කරන්නත් මෙයින් කටයුතු කිරීමේ හැකියාව තිබෙනව.

අපි හඳුන්වා දුන්නු මේ ප්‍රතිපත්තිය මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ වගකිවයුතු පාර්ශව පිළිඅරගෙන ඉදිරි ක්‍රියාමාර්ගවලට යොමු වීම අපට සතුටක්.

පළාත් සභාවක් හැටියට ඉලක්කගත ඉදිරි ගමනක් යන්න නම් දැන් පවත්නා තත්ත්වය ඒ කියන්නේ අපි දැන් ඉන්නේ කෙතැනද කියන එක අනිවාර්යයෙන්ම විශ්ලේෂණය කරන්න වෙනවා. ඉදිරි සැලසුම් හදන්න වෙන්නේ ඒ අනුවයි.

ඒ වගේම සංවර්ධනයට සම්බන්ධ බොහෝ ආයතන නැත්නම් පාර්ශවකරුවන් තනි තනිව තම තමන්ගේ ගමනාන්තයන් සොයා යන අසංවිධිත තත්ත්වය පළාතේ සංවර්ධනයට තිබෙන විශාලම බාධාවක්.

මේ බාධාව මඟහරවන්න අපි මැදිහත්කරුවෙක් විදිහට වැඩ කළ යුතු බව අපේ උපායමාර්ග සැලැස්ම තුළ අපි හඳුනාගත්තා.

ඒ අනුව පළාතේ සංවර්ධනයෙදි අවධානය හිමි විය යුතු ක්ෂේත්‍ර ඒකාබද්ධ කරමින් 2019 වසරෙදි සබරගමුව පළාතට “දැක්ම කේන්ද්‍රකරගත් පස් අවුරුදු ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක්” සකස් කරල තියනව. මේ සැලැස්ම ඉදිරි පස් වසරට පළාත් සැලසුම්කරණයට මාර්ගෝපදේශ සපයනව.

අපි මෙතෙක් අපගේ ව්‍යාපෘති මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය සිදුකළේ සාම්ප්‍රදායික ක්‍රමයට. අපේ උපායමාර්ගික සැලැස්ම තුළ එය අපගේ දුර්වලතාවයක් ලෙස අපි හඳුනාගන්නව.
එය නිවැරදි කරල කාර්යක්ෂම කරන්න අපි දැන් “ඒකාබද්ධ වාර්ෂික සංවර්ධන වැඩසටහන” නමින් අදාළ ක්‍රියාවලිය මාර්ගගත කරල තියෙනව.

මෙතෙක් සම්ප්‍රදායික ක්‍රමයට කරපු ප්‍රගතිවාර්තා සකස් කිරීම නිසා සිදු වන කාලය හා සම්පත් නාස්තිය මේ තුළින් අවම කරගෙන තියනවා.

ඒ වගේම අපගේ ආයතනයේ වෙබ් අඩවිය ඍජුවම සේවාලාභීන් ඉලක්ක කරගත් උපකාරක කවුළුවක් හැටියට සේවා සැපයීමට සූදානම් කරල තියනව.

අපි ඒ විධියට උපකාරක කවුළුවක් නිර්මාණය කළේ සේවාලාභීන්ට දුර බැහැර ඉඳල කාර්යාලයට එන්නෙ නැතිව තමන්ගේ කාර්යයන් ඒ ඒ ඉන්න තැන්වල ඉඳගෙන කරන්න ඉඩ හසර හදල දෙන්න.
උපාධිධාරීන්/ ඩිප්ලෝමාධාරීන් පිළිබඳ සමීක්ෂණය, වෘත්තීය මංපෙත වැඩසටහන ඒ අතර කැපී පෙනෙනව.

කියමනක් තියනව “පනින්නට පෙර හිතල බලන්න” කියල.
නිවැරදි තීරණයක් තමයි වැදගත් වෙන්නෙ.
තීරණයක් ගන්න නම් දත්ත විතරක් නොවෙයි තොරතුරුත් උවමනා කරනවා.
දත්ත, තොරතුරු භාවිතා කරන ප්‍රමාණය වැඩිවෙන තරමට ඔවුන්ගේ  තීරණ ගැනීම සාර්ථක වෙනවා.

සැලසුම්කරණයේදී අදාළ කණ්ඩායම්වලට දත්ත හා තොරතුරු භාවිතා කිරීම දිරිගන්වන්න අපි උපායමාර්ග කිහිපයක් අනුගමනය කරල තියනවා.
එකක් තමයි බිම් මහලේ අපි පවත්වගෙන යන “තොරතුරු කේන්ද්‍රය”. තොරතුරු උවමනා කෙනෙකුට පළාතේ සමාජ, ආර්ථික, භූගෝලීය ආදී තොරතුරු මෙතනින් ලබා ගන්න පුළුවන්.

අපි වාර්ෂිකව නිකුත් කරන සංඛ්‍යාලේඛණ අත්පොත තොරතුරු පරිශීලකයන්ට එය පහසුකරවන තවත් ක්‍රමයක්.
මෙය නිතරම ළඟ තබාගත හැකි මූලික දත්ත, තොරතුරු බොහෝ ප්‍රමාණයක් අඩංගු කුඩා අත්පොතක්. මෙහි අන්තර්ගතයත් පරිශීලකයන්ගේ ප්‍රතිචාර අනුව වාර්ෂිකව දියුණු කරමින් තමයි අපි සකස් කරන්නෙ.

එතැනින් නොනැවතුනු අපි වඩාත් ප්‍රතිඵලදායකව අපේ මෙහෙවර ඉටු කරන්න “තීරණ මැදිරිය” නමින් ප්‍රවේශයක් හඳුන්වල දීල තියනව.

අපේ මෙහෙවර හරහා ප්‍රජාවට කරනු ලබන සේවාවන්වල ඵලදායී බව මැනීමට හා ඒ හරහා ප්‍රතිපෝෂණයක් ලබාදීමට මේ තිරණ මැදිරිය යොදාගන්න පුළුවන්.
දත්ත, තොරතුරු විශ්ලේෂණයක් අවශ්‍ය ඕනෑම පාර්ශවකරුවෙකුට හෝ අධ්‍යාපන කටයුතු කරන කවර පාර්ශවයකට උනත් මේ සේවාව ලබාගන්න පුළුවන්.
තීරණ මැදිරිය හා සම්බන්ධවන බාහිර පාර්ශවකරුවන්ට අප හා සම්බන්ධ වීමට අවස්ථාව ලබා දෙන්න අපි විද්‍යුත් පුස්තකාලයකුත් ඒ කියන්නෙ (E Library එකකුත්) හදලා තියෙනවා.
අපේ ප්‍රතිපත්ති රාමුවේ "සබරගමු කතිකාවත" නමින් එළි දැක්වූයේ මෙම වැඩසටහනට අදාළ සංකල්පයයි.

ඒ වගේම පළාතේ සංවර්ධන කටයුතුවලදී මූල්‍ය සම්පත් සීමා වෙන අවස්ථාවල වෙනත් බාහිර පාර්ශවයන්ගේ සහාය ලබාගෙන අවශ්‍යතා කළමණාකරණය කරගන්න කටයුතු කිරීමේ උපායමාර්ගයක් අපි අනුගමනය කරනවා.
එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන, දකුණු කොරියානු සේමාවුල් ගෝලීයකරණ පදනම යන විදේශ අරමුදල් ප්‍රභවයන් අපි සම්බන්ධ කරගෙන තිබෙනව.

අපි කලින් සඳහන් කරපු "දැක්ම කේන්ද්‍රකරගත් පස් අවුරුදු ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම" සකස් කරන්න මූල්‍ය දායකත්වය අපි ලබාගන්නෙ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලින්.

අපගේ මෙහෙවර ඉදිරියට ගෙනයන්න අපේ කාර්යමණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව වැඩි කරන්න අපි සැලසුම්කරල තියනව. ඒ සඳහා මානව සම්පත් සංවර්ධනය සැලසුමක් අපි හදල ඒ අනුව කාර්යමණ්ඩලයට පුහුණු අවස්ථා ලබා දෙනව.

ඒවගේම කාර්යාලයේ වැදගත්ම කුලකය මානව සම්පත බව අවබෝධ කරගෙන ඔවුන්ව තෘප්තිමත් මනසකින් නිතරම තියාගන්න විශේෂයෙන් වගබලාගන්නව.

ඒ වගේම කාර්යමණ්ඩලයට රාජකාරි පහසුවෙන් කරගෙන යන්න අවශ්‍යකරන පහසුකම්, ක්‍රමවේද නිරතුරුවම වැඩිදියුණු කරන්න ආයතනයේ ඉහළ කළමණාකරණ මට්ටම් අවධානය දීල තියෙන බවට මේ උදාහරණ සාක්ෂි දරනව.

අපි දැන් සියළු අංශවලින් පරිපූර්ණ කාර්යාලයක් !
මෙතෙක් අපට නොතිබුණු අපේම ගිණුම් අංශයක් අපි ආරම්භ කරල තියෙනව.
වාර්ෂිකව කරන විගණන පරීක්ෂාවෙන් මේ ගිණුම් අංශයත් ඇතුළු සමස්ත ආයතනය ගැන යහපත් විගණන මතයක් දිනාගන්න අපි සමත් වෙලා තියනව.

මේ ඔබහමුවේ ඉදිරිපත් වන්නේ අපි 2018 හා 2019 වසරවල සිදුකළ මෙහෙවරෙන් බිඳක් පමණයි.

මේ ආකාරයට වැඩදායී මෙහෙවරක් ඉටු කරමින් ආපු ගමන පිළිබඳව අපිට තියෙන්නෙ සතුටක්.
නිහතමානි ආඩම්බරයක්.

2017 සහ 2018 වර්ෂ වලදී අඛණ්ඩව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්මල මූල්‍ය කළමණාකරණය සහ කාර්යක්ෂම කාර්යසාධනය සඳහා වන "ස්වර්ණ සම්මානය" අපි දිනාගන්න සමත් වෙනව.
ඒ වගේම 2015 සිට ජාතික ඵලදායීතා සම්මාන තරඟාවලියේ දී අඛණ්ඩවම අන්තර් පළාත් අමාත්‍යාංශ අතර තුන්වන ස්ථානයේ රැඳී සිටීමට සමත් වෙලා තියනව.

ඒ සියල්ලත් එක්ක අපේ මෙහෙවරේ ප්‍රතිලාභ අත්විඳින තෘප්තිමත් සේවාලාභීන් නිසා අපේ කණ්ඩායම ලබන ආත්ම තෘප්තිය හෙට දවසේ තවත් වැඩි ගුණාත්මක සේවයක් සපයන්න අපිට පාර කියනව.

- “අපේ ගෙදර” වැඩසටහන ජන ජීවිත වෙනස් කරපු අපූරුව
- එවකට අපේ පළාතේ ප්‍රධාන පුරවැසියා වන ගරු ආණ්ඩුකාරතුමා 2019 ජුනි 12 වැනිදා පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරිමේ නිලධාරීන් විසිර යාමේ උත්සවයේදී අපේ මෙහෙවර අගයන්න අමතක කළේ නැහැ.
- ජාතික වැදගත්කමක් හිමි ජාතික කිතුල් සංවර්ධන අධිකාරියක් පිහිටුවීම පිළිබඳව වූ පනත් කෙටුම්පත ජනගත කිරීමේ මොහොත.
- කිතුල් කර්මාන්තකරුවකු ව්‍යාවසායකයකු ලෙස සාර්ථක වූ කතාව සෑම තරාතිරමකම ව්‍යවසායකයෙකුට මඟ පෙන්වාවි.
- සේමාවුල් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සබරගමුවේ ජන ජීවිත නඟා සිටුවීමට නව ප්‍රවේශයක් වූ වග.

**අපි සබරගමුවෙ සැලසුම්කරණයේ මහගෙදර !**